# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 12,836—1961 දෙසැම්බර් 28 වැනි බ්‍රහස්පතින්ද—28.12.1961**

**(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ජෙදය – සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

**එල්.ඩී.—සීඑෆ්ජ්. 26/39.**

### ආරක්ෂක (අපනයන පාලන) නියෝග

**1950** අංක 27 දරන ආනයන හා අපනයන පාලන (අවිච්ඡෙද) පනත යටතේ නීතියේ බලය ලත් ආරක්ෂක (අපනයන පාලන) නියෝගවල 3 (2) දරන නියෝගය ප්‍රකාර වාණිජ, වෙළඳ, ආහාර හා නැව් කටයුතු පිළිබඳ ඇමතිවරයා විසින් පනවනු ලබන ආඥාවයි.

ටී. බී. ඉලංගරත්න,
වාණිජ, වෙළඳ, ආහාර හා නැව් කටයුතු පිළිබඳ ඇමති.

**1961** දෙසැම්බර් මස 23 වෙනි දින,
කොළඹ දීය.

**ආඥාව**

**1953** මාර්තු 27 වෙනි දින අංක 10,512 දරන ගැසට් පත්‍රයෙහි පළ වූ (කිසියම් පශ්චාත් ආඥාවකින් සංශෝධනය වූ පරිදි) ආරක්ෂක (අපනයන පාලන) නියෝගවල 3 (2) දරන නියෝගය යටතේ බලපත්‍රයක අවශ්‍යතාවයෙන් නිදහස් කෙරෙන ආඥාවෙහි 1 (සී) දරන ඡෙදය ''ලිතුවේනියාව හා පෝර්මෝසාව'' යන වචන වෙනුවට ''ලිතුවේනියාව, පෝර්මෝසාව, කොරියාව හා වියට්නාමය'' යන වචන ආදේශ කිරීමෙන් තවදුරටත් සංශෝධනය කෙරේ.

12–1999/1

---

## විවිධ දෙපාර්තමේන්තු දන්වීම්

එල්.ඩී.—සීඑෆ්ජ්. 26 ඒ2/39.

### ආරක්ෂක (ආනයන පාලන) නියෝග

**නිවේදනය**

**1950** අංක 27 දරන ආනයන හා අපනයන පාලන (අවිච්ඡෙද) පනත යටතේ නීතියේ බලය ලත් ආරක්ෂක (ආනයන පාලන) නියෝගවල 5ඒ නියෝගය යටතේ ලත් බලය අනුව, වැඩ බලන ආනයන පාලක එඩ්වර්ඩ් ස්ටීවන් ද සිල්වා වන මම, වර්ෂ 1951 ජූලි 3 වෙනි දින නිකුත් කරන ලද අංක 10,265 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ (පසුව යම් නිවේදනයකින් සංශෝධනය කළ පරිදි) පළ වූ 1951 ජූනි 28 වෙනි දින අංක 1 දරන අසීමිත සාමාන්‍ය බලපත්‍රය ''ස්පාඤ්ඤය හා පෝර්මෝසාව'' යන වචන වෙනුවට ''ස්පාඤ්ඤය, පෝර්මෝසාව, කොරියාව හා වියට්නාමය'' යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරමි.

ඊ. එස්. ද සිල්වා,
වැඩ බලන ආනයන පාලක.

1961 දෙසැම්බර් මස 23 වෙනි දින,
කොළඹ දී ය.

12–1999/2


**2369**—ජේ. ඇන්. ආර් 577—5,100 (12/61)

එල්.සී.—සීඑෆ්. 26 ඒ2/39.

## ආරක්ෂක (ආනයන පාලන) නියෝග

### නිවේදනය

1950 අංක 27 දරන ආනයන හා අපනයන පාලන (අධිච්ඡෙද) පනත යටතේ නීතියේ බලය ලත්, ආරක්ෂක (ආනයන පාලන) නියෝගවල 5ඒ නියෝගය යටතේ ලත් බලය අනුව, වැඩ බලන ආනයන පාලක එඩ්වර්ඩ් ස්ටීවන් ද සිල්වා වන මම, වර්ෂ 1952 සැප්තැම්බර් 24 වෙනි දින නිකුත් කරන ලද අංක 10,452 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ (පසුව යම් නිවේදනයකින් සංශෝධනය කළ පරිදි) පළවූ 1952 සැප්තැම්බර් 23 වෙනි දින අංක 4 දරන අසීමිත සාමාන්‍ය බලපත්‍රය ''ස්පාඤ්ඤය හා පෝර්මෝසාව'' යන වචන වෙනුවට ''ස්පාඤ්ඤය, පෝර්මෝසාව, කොරියාව හා වියට්නාමය'' යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරමි.

ඊ. එස්. ද සිල්වා,
වැඩ බලන ආනයන පාලක.

1961 දෙසැම්බර් මස 23 වෙනි දින,
කොළඹ දී ය.

12–1999/3

---

## අංක 18/61 දරන අපනයන පාලන දැන්වීම

### කොරියාවට හා වියට්නාමයට අපනයන

කොරියාවට හෝ වියට්නාමයට හෝ බඩු අපනයනය සාමාන්‍ය අපනයන බලපත්‍ර හෝ පෞද්ගලික අපනයන බලපත්‍ර හෝ ලත් ලියා පදිංචි ලාංකික වෙළඳුන්ට පමණක් එහි සඳහන් කොන්දේසි හා ව්‍යවස්ථාවනට යටත්ව කළ හැකි බව අපනයනකරුවන් වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඊ. එස්. ද සිල්වා,
වැඩ බලන ආනයන හා අපනයන පාලක.

1961 දෙසැම්බර් මස 23 වෙනි දින,
කොළඹ දීය.

12–1999/4

---

## අංක 43/61 දරන ආනයන පාලන දැන්වීම

### කොරියාවෙන් හා වියට්නාමයෙන් ආනයන

කොරියාවේ හෝ වියට්නාමයේ හෝ නිපැදවූ හෝ ඉපැදවූ හෝ බඩු ආනයනය සාමාන්‍ය ආනයන බලපත්‍ර හෝ පෞද්ගලික ආනයනය බලපත්‍ර හෝ ලත් ලියා පදිංචි ලාංකික වෙළඳුන්ට පමණක් එහි සඳහන් කොන්දේසි හා ව්‍යවස්ථාවනට යටත්ව කළ හැකි බව ආනයනකරුවන් වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඊ. එස්. ද සිල්වා,
වැඩ බලන ආනයන හා අපනයන පාලක.

1961 දෙසැම්බර් මස 23 වෙනි දින,
කොළඹ දීය.

12–1999/5

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි '' ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන් '' හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි.